බන්ධ.කො.ජ චක්‍රලේඛ අංක ෴...36..../2014

මගේ අංක ෴- කේ / 08 /සැක/2014,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2014-08-19 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන් හා සහකාර අධිකාරීන් වෙත,

**රක්ෂිත බන්ධනාගාර ගත කරන සැකකරුවන්ගේ රහසය වාර්තා ලබා ගැනිම**

දැනට පොලිස් ස්ථාන මගින් ගරු අධිකරණ වෙත ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලබන සැකකරුවන්ගේ අපරාධ ඉතිහාසය, වරදේ ස්භාවය,පොලිස් අත් අඩංගුවෙන් පැනයාම,මානසික රෝගි තත්වය වැනි පුළුල් අවබෝධයක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව නොමැති විමෙන් සැකකරුවන් රදවා තැබිම , ආරක්ෂණය කිරිම , රෝහල් ගත කිරිම වැනි අවස්ථාවලදි පැනයාම,පැහැර ගැනිම ,හා සැකකරුගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මහත් ගැටළුකාරී තත්වයක් පැන නගින අතර මෙම තත්වය මග හරවා ගැනිම සදහා සැකකරුවන් රක්ෂිත බන්ධනාගාර ගත කිරිමේදි ඔවුන් පිළිබදව රහසය වාර්තාවක් පොලිස් ස්ථාන මගින් ලබා දෙන ලෙසට මා විසින් පොලිස්පති වෙතින් ඉල්ලිමක් කරන ලදි.

එම ඉල්ලිමට අනුව පොලිස්පති විසින් මා වෙත එවන ලද අංක ෴- StaffDIG/IG/out/08/472/14 හා 2014-08-05 වන දිනැති ලිපිය මගින් රක්ෂිත බන්ධනාගාර ගත කරන සැකකරුවන් පැන ගිය ඉතිහාසයක් ඇති, අන්තරාකාරී සාහසික අපරාධකරුවන්ද යන්න පිළිබද රහසය වාර්තාවත් ඔවුන් බන්ධනාගාර ගත කරන අවස්ථාවේදි බන්ධනාගාර නිලධාරීන් වෙත ලබා දෙන ලෙසට සියළු පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවක් කර ඇති බවට දන්වා ඇත.

එබැවින් මින් ඉදිරියේදි පොලිස් ස්ථාන මගින් අධිකරණවලට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කරන ලද සියළුම සැකකරුවන්ගේ රහසය වාර්තාවක් සැකකරුවන් රැගෙන එන ලද පොලිස් නිලධාරීන්ගෙන් ලබා ගැනිමට කටයුතු කරන ලෙසට දන්වා සිටිමි. පොලිස්පතිතුමා විසින් මා වෙත එවන ලද ලිපියේ පිටපතක් මේ සමග අමුනා ඇති අතර මේ සම්බන්ධව ගැටළුවක් ඇත්නම් ඒ පිළිබදව පොලිස්පතිතුමා දැනුවත් කිරිමට සදහා මා වෙත වාර්තා කරන ලෙසට දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.